**හොරොව්පතාන ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**---------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**-----------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ** විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 21 දින සභාපතිවරයා වෙත යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට **හොරොව්පතාන** ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

---------------------------

ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව සභාව විසින් උපචිත පදනම මත ගිණුම් සකස් කර තිබෙන බව දක්වා තිබුණද උසාවි දඩ,මුද්දර ගාස්තු හා සේවක ණය පොලී එම පදනමෙන් බැහැරව ගිණුම්ගත කර තිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 වර්ෂයේ සිට සභාව විසින් පරිහරණය කරනු ලබන පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ඉදිකර තිබෙන ගොඩනැගිලි, ලබාදී තිබුණු පරිගණක හා වෙනත් උපකරණවල එකතු වටිනාකම රු.44,245,009 ක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේදී දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සභාවට ලබාදුන් රු.224,750 ක් වටිනා ගැල්වනයිස් කොඩිකණු 203 ක් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සභාව සතු ස්ථාන 17 ක පිහිටි දේපල බදුදීම සඳහා එළඹ තිබුණු ගිවිසුම් ප්‍රකාරව වර්ෂය තුල අයවිය යුතු මුළු බදු කුලිය රු.4,554,740 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.4,502,507 ක් ලෙස දැක්වීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා ලැබිය යුතු කුලී රු. 52,233 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල රු.103,202 ක උපචිත වියදම් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් වර්ෂයේ වියදම් හා ජංගම වගකීම් එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) 2018 වර්ෂයේ මුදල් ගෙවා තිබුණු එකතුව රු. 85,000 ක් වූ ව්‍යාපෘති 03 ක් කර්මාන්ත ණයහිමියෝ යටතේ දක්වා නොතිබීම හේතුවෙන් කර්මාන්ත ණයහිමියෝ හා ප්‍රාග්ධන වැය එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබුණු රු. 25,255 ක් වටිනා ස්ථාවර වත්කම් විෂයයන් 02 ක් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුම එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් නල ළිං වලින් අයවිය යුතු ආදායම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඌ) 2013 වර්ෂයේ රු.135,750 ක් 2014 වර්ෂයේ රු.178,950 ක් ලෙස ගිණුම්ගත කල මුද්දර ගාස්තු වලින් පිළිවෙලින් රු.122,250 හා රු. 155,000 බැගින් ලබා දීමට පළාත් ආදායම් කොමසාරිස් එකඟ වී තිබිය දී වැඩියෙන් ගිණුම්ගත කර තිබූ රු.37,450 ක මුදල ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ). 2016 හා 2017 වර්ෂ සඳහා මුද්දර ගාස්තු ආදායම් ගණනය කර ගිණුම්ගත කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඒ) සභාව යටතේ පාලනය වන මොරවැව, වාගොල්ලාකඩ හා සමගිගම යන ස්ථාන වල ඇති RO ජල පිරිපහදු පද්ධති 03 ලේඛනගත වී නොතිබූ අතර ඒවාගේ වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි.

1.3.3 නොසැසඳුණු ගිණුම්

---------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශනවල ආදායම් හා වියදම් ගිණුමේ දැක්වෙන ආදායම් ශේෂයන් හා ප්‍රා.ස. 04 හි දැක්වෙන ආදායම් ශේෂ අතර රු.1,003,904 ක වෙනසක් තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල 2017 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබුණු පුස්තකාල පොත්වල වටිනාකම රු.2,035,095 ක් වුවද පුස්තකාල සහායක පරිග්‍රහන ලේඛනය අනුව එදිනට වටිනාකම රු.1,727,450 ක් වීමෙන් රු.307,645 ක නොසැසඳුනු ශේෂයක් විය.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---------------------------------

වර්ෂ ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පවතින එකතුව රු.83,385 ක්වූ තොග ශේෂ 02 ක් හා එකතුව රු.534,443 ක් වූ ගෙවිය යුතු ශේෂ 05 ක් හඳුනාගෙන නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය තුලදී ද කටයුතු කර නොතිබුණි.

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

---------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.9,632,455 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## 1.3.6 අනුකූල නොවීම

### 1.3.6.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 177 වගන්තිය | සභාවේ සේවය කරන තාවකාලික හා අනියම් සේවකයන් වෙනුවෙන් පාරිතෝෂික ගෙවීම සඳහා වූ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 5.11 | සභාව සතු මාර්ගස්ථ මුදල් සහ වෙනත් වටිනා භාණ්ඩ සම්බන්ධයෙන් රක්ෂණ ආවරණයක් ලබාගෙන නොතිබුණි |
| (ii) රීති 33 | වරිපනම් ගෙවීම් පැහැර හරින පුද්ගලයන් පිළිබඳව ලැයිස්තුවක් සහ දේපල තහනම් කිරීමේ වරෙන්තු එක් එක් කාර්තුව අවසානයේදී පිළියෙල කර නොතිබුණි. |
| (iii) රීති 217 හා 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් PS 46 ආකෘතිය ප්‍රකාර ලේඛණයක් පවත්වා ගෙන නොතිබුණු අතර සියළු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් පරීක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (iv) රීති 261.2 | රු.50,000 තත්කාර්ය අතුරු අග්‍රිමයක් 2017 පෙබරවාරි 20 දින නිලධාරියෙකුට ලබාදී තිබුණද අතර එම අත්තිකාරම් 2018 අප්‍රේල් 20 වන විටත් පියවා නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ.571,572 | සභාවේ පොදු තැන්පත් ලේඛනයට අනුව වර්ෂ 02 ක් ඉක්මවූ එකතුව රු.690,173 ක් වටිනා ආපසු ගෙවිය යුතු තැන්පත් 34 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 203 වන අධිකාරිය මෝටර් වාහන පනතේ 2(1) වගන්තිය | 2005 වර්ෂයේ සිට සභාවට ලැබී තිබුණ අත් ට්‍රැක්ටරයක්, ට්‍රේලර් 02 ක් හා ජල බවුසරයක් 2018 අප්‍රේල් 20 දින වන විටත් ලියාපදිංචි කර නොතිබුණි. |
| (ඉ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | සභාව භාවිතා කරන පරිගණක හා පරිගණක මෘදුකාංග පිළිබඳ වෙනම ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,397,859 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,164,830 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්
----------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් වර්ගය | 2017 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය | 2017 වර්ෂයේ බිල්කළ ආදායම | 2017 වර්ෂයේ රැස් කළ ආදායම | | 2017 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ආදායම |
|---|---|---|---|---|---|
| | වටිනාකම | වටිනාකම | 2017 ජනවාරි 01 දිනට ශේෂයන් ලැබීම් වටිනාකම | 2017 වර්ෂයට බිල්කළ ආදායම් ලැබීම් වටිනාකම | වටිනාකම |
| | රු. | රු. | රු. | රු. | රු. |
| හිඟ වරිපනම් | 129,152 | 56,129 | 20,894 | 27,715 | 136,672 |
| හිඟ කසල | 910,100 | 321,600 | 136,900 | 172,700 | 922,100 |
| හිඟ කඩකුලී | 1,747,030 | 444,000 | 320,300 | 111,100 | 1,759,630 |
| හිඟ බදුකුලී | 3,712,093 | 4,502,507 | 28,236 | 3,198,693 | 4,987,671 |
| හිඟ බලපත්‍ර | 1,033,300 | 55,500 | - | 55,500 | 1,033,300 |
| හිඟ උසාවි දඩ | 734,465 | 787,551 | - | - | 1,522,016 |
| හිඟ මුද්දර ගාස්තු | 1,291,950 | 300,000 | - | - | 1,591,950 |
| හිඟ නළලිං ගාස්තු | 375,900 | 800 | 8,000 | 800 | 367,900 |
| එකතුව | 9,933,990 | 6,468,087 | 514,330 | 3,566,508 | 12,321,239 |

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ආදායම් සම්බන්ධ ලේඛන නිසි පරිදි නඩත්තු නොකිරීම හේතුවෙන් හිඟහිටි ආදායම් ඒකක ගණන හා බිල්කල ආදායම් ඒකක ගණන දැක්වීමට සභාව අපොහොසත් විය.

(ආ) වර්ෂයේ බිල්කළ ආදායම රු.6,468,087 ක් වූ නමුත් 2017 දෙසැම්බර් 31 දිනට හිගහිටි ආදායම් වල එකතුව රු.12,321,239 ක් වූයෙන් බිල්කළ ආදායම මෙන් සියයට 190 ක හිගහිටි ආදායම් දක්නට ලැබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ රු. 9,933,990 ක් වූ මුළු හිඟහිටි ආදායමෙන් සියයට 5.17 ක් වූ රු. 514,330 ක් පමණක් වර්ෂය තුල අයකරගෙන තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් බිල්කල මුළු ආදායම රු.6,468,086 ක් වුවත් ආදායම් වියදම් ගිණුමේ එය රු. 9,755,194 ක් ලෙස දැක්වීමෙන් රු.3,287,108 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

2.2.3 වරිපනම් හා බදු

------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වරිපනම් බදු සඳහා බිල් කිරීම රු. 55,752 ක් වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට හිඟ වරිපනම් රු. 136,672 ක් වූයෙන් එය වාර්ෂික බිල් කිරීම මෙන් සියයට 245 ක් තරම් ඉහල අගයක් විය. හිඟ මුදල් අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුල වරිපනම් බදු අයකරන දේපල 1994 වර්ෂයෙන් පසු තක්සේරු කිරීමට සභාව කටයුතු කර නොතිබුණු අතර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 134 වගන්තිය ප්‍රකාර සංවර්ධිත ප්‍රදේශයක් ලෙස නම් කළ ප්‍රදේශ තුල වරිපනම් අයකල යුතු ස්ථාන වලින් වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 කුලී හා බලපත්‍ර ආදායම්

---------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වාරික 2 සිට 151 දක්වා වූ හිඟහිටි කුලී ආදායමේ එකතුව රු.6,747,301 ක් වූ අතර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාරව හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එන හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු රු.1,033,300 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුල ද කටයුතු කර නොතිබුණි.

(ඇ) ගවයින්ට කුර රෝගය වැළඳීම නිසා මාස ගණනක් බදු ස්ථාන වසා තැබීම හේතුවෙන් එකතුව රු.83,735 ක් කපා හැරීමට සභාව තීරණය කර තිබුණද ඒ සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

2.2.5 වෙනත් ආදායම්

-------------------

(අ) කසල ගාස්තු බදු

-------------------

සමාලෝචිත වර්ෂය ආරම්භයේ රු.910,100 ක් වූ හිඟ කසල ගාස්තු වර්ෂය අවසාන වන විට රු.922,100 ක් වී තිබුණු අතර හිඟය අයකර ගැනීමට සභාව නිසි වැඩ පිළිවෙලක් සකස්කර නොතිබුණි.

(ආ) නල ළිං ගාස්තු

-----------------

සමාලෝචිත වර්ෂය අවසාන වන විට නල ළිං 169 කින් අයවිය යුතු ගාස්තුවල එකතුව රු.367,900 ක් විය. එම නල ළිං වලින් ක්‍රියාත්මක තත්වයේ පවතින නල ළිං සංඛ්‍යාව පිළිබඳ තොරතුරු සභාව සතුව නොතිබුණු අතර හිඟ ගාස්තු අයකර ගැනීමට නිසි වැඩ පිළිවෙලක්ද සකස් කර නොතිබුණි.

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

(අ) උසාවි දඩ

-----------

පළාත් භාණ්ඩාගාරයෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ මුදල රු.1,522,016 ක් විය.

(ආ) මුද්දර ගාස්තු

---------------

සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු.1,291,950 ක් වූ හිඟ මුද්දර ගාස්තු මුද්දර ගාස්තු ලේඛනය අනුව රු. 634,375 ක් වුයෙන් රු.657,575 ක වෙනස සඳහා තොරතුරු ඉදිරිපත් නොකෙරුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

3.1 කාර්යසාධනය

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගී සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

----------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වුවත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් එම කාරණා වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

--------------------

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2014 පෙබරවාරි 17 දිනැති 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ). අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම
-------------------------------------
පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2011 වර්ෂයේ ජාතික සවිය ගමනැගුම වැඩ සටහන යටතේ වැඩ ආරම්භ කරන ලද වාහල්කඩ ජාතික ජල යෝජනා ක්‍රමය සඳහා රු3,544,028 ක් වැය කර තිබුණද වැඩ අවසන් කර ප්‍රදේශයේ ජනතාවගේ ජල අවශ්‍යතා සපුරාදීමට අවශ්‍ය පියවර සමාලෝචිත වර්ෂය අවසන් වනතුරු ගෙන නොතිබුණි.

(ii) රු. 3,945,583 ක් වැයකර තිබූ පිළිසරු ව්‍යාපෘතියේ වැඩ 2017 වර්ෂයේ අවසන් කර තිබුණද, විදුලිය හා ජලය සපයා නොතිබීම හේතුවෙන් 2018 අප්‍රේල් වන විටත් ව්‍යාපෘතිය මහජන ප්‍රයෝජනය සඳහා ලබාදී නොතිබුණි.

(ඈ). කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්
-------------------------------------
සමාලෝචිත වර්ෂය තුල ඉටු කිරීමට අනුමත වූ රු. 875,000 ක ව්‍යාපෘති 05 ක් දෙසැම්බර් 31 දින වන විටත් නිමකර නොතිබුණි.

(ඉ) පාරිසරික ගැටළු
-------------------
හොරොව්පතාන වව්නියාව මාර්ගය අසල මොටගෝනෑව ප්‍රදේශයේ රජයේ ඉඩමක විවෘත භූමියකට දිනකට එකතුවන කසල ටොන් 02 ක් පමණ බැහැර කිරීම නිසා අවට ප්‍රදේශයේ ජනතාවගේ සාමාන්‍ය ජන ජීවිතයට ඒ හරහා විවිධ සෞඛ්‍ය ගැටළු මතුවී තිබුණු නමුත් සභාව ඒ සඳහා ස්ථිර විසඳුම් ලබාදී නොතිබුණු බව නිරීක්ෂණය විය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
--------------------------------
පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් නඩත්තු කරනු ලබන ඉඩම් හා ගොඩනැගිලි 08 ක් සඳහා පළාත් පාලන හා ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ අංක 03 පරිදි හිමිකම් ඔප්පු හා පිඹුරුපත් ලබා ගැනීමට, එම ඉඩම්වල මායිම් ලකුණු කිරීමට හා ඒවායේ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය
--------------------------------
සභාවේ සේවය කර දිර්ඝ කාලයකට පෙර විශ්‍රාම ගිය, මියගිය හා සේවය අත්හැර ගිය සේවකයින් 15 දෙනෙකුගෙන් අයවිය යුතු රු.88,149 ක් අයකර ගැනීමට ආයතන සංග්‍රහයේ xxiv පරිච්ජේදයේ 4 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බල ප්‍රදේශය තුළ සුසාන භූමි 70 ක් සඳහා රජයේ ඉඩම් වෙන්කර තිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් 2006 නොවැම්බර් 14 දිනැති අංක PL/07/01/53 දරන පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ අංක 09 හි යෝජනා හා නිර්දේශ අනුගමනය කර නොතිබුණි

(ආ) සමාලෝචිත වර්ෂය තුල සභාව විසින් සංවර්ධන බලපත්‍ර 15 ක් නිකුත් කර තිබුණ ද ඊට අදාල අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. අනවසර ඉදිකිරීම් පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් සභාවට නොතිබුණ අතර අනවසර ඉදිකිරීම් හේතුවෙන් අනාගතයේදී පාරිසරික ගැටළු පැන නැගීමට හැකියාව නිරීක්ෂණය විය.

(ඇ) හොරොව්පොතාන නගරයේ එළ ගවමස් හල බදු ගත් බදුකරු ව්‍යාපාරය දිගටම සිදුකල නොහැකි බව 2017 ජනවාරි 25 දින ලිපියක් මගින් දැනුම් දී තිබුණද එකී දේපළ නැවත බදු දීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඈ) බදු ගත් දේපළවල ව්‍යාපාර කටයුතු සිදු කිරීමට නොහැකි බව දන්වා තිබූ ව්‍යාපාරික ස්ථාන 5 ක හිඟ බදු රු. 1,256,440 ක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට පළාත් පාලන දෙපාර්තුමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

3.5 නිශ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්

-----------------------------------------

සභාව සතු වාහන හා උපාංග 08 ක් ප්‍රයෝජනයට නොගෙන ගාල්කර තිබුණු අතර, ඒවා අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ, අළුත්වැඩියා කිරීමට නොහැකි නම් අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

------------------------------------------

4.1 අයවැය පාලනය

--------------------

නිසි පුරෝකථනයකින් තොරව අයවැය ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයන් 03 ක අයවැයගත ආදායම හා තත්‍ය ආදායම අතර සියයට 44 සිට සියයට 62 දක්වා විචලනයන් සහ වියදම් විෂයයන් 6 ක අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර සියයට 14 සිට සියයට 70 දක්වා විචලනයන් නිරීක්ෂණය විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

4.2 අභ්‍යන්තර විගණනය

-------------------------

උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 2015 මාර්තු 18 දිනැති අංක 04/2015 දරන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර තිබුණද විගණන වාර්තා නිකුත් කර නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු

-------------------------------------

2009 ජුනි 09 දිනැති DMA/2009 (1) අංක දරන කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුව 2017 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි.

5 පද්ධති හා පාලන

------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| | ------------- | ---------- |
| (අ) | ආදායම් රැස් කිරීම. | i. ආදායම් ඇස්තමේන්තු සකස් නොකිරීම.<br>ii. හිඟ ආදායම් රැස් කිරීම කාර්යක්ෂම නොවීම.<br>iii. දේපල තක්සේරු නොකිරීම. |
| (ආ) | සැලසුම් කිරීම | සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබීම. |
| (ඇ) | ස්ථාවර වත්කම් | i. වත්කම් ලේඛනගත නොකිරීම.<br>ii. සභාව භාවිතා කරන දේපලවල අයිතිය පවරා නොගැනීම.<br>iii. නිශ්ක්‍රීය වත්කම් පැවතීම. |
| (ඇ) | අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණනය සිදුකර වාර්තා ඉදිරිපත් නොකිරීම. |